# ලෝකාලෝකය

## 2020 දෙසැම්බර් - 2021 පෙබරවාරි කලාපය

**මක්නිසාද අපට ළදරුවෙක් උපන්නේය,**
**අපට පුත්‍රයෙක් දෙනලද්දේය;**
**ආණ්ඩුවද උන්වහන්සේගේ කර පිට තිබෙන්නේය.**
**උන්වහන්සේ අපූර්වය, මනිත්‍රීවරයාය,**
**පරාක්‍රමවත් දෙවියන්වහන්සේය, සදාකාල පියාණෝය,**
**සමාදානයේ කුමාරයායයි කියනු ලබන්නේය.**
**(යෙසායා 9:6)**

ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය
අංක - 07, විවේකානන්ද පාර, වැල්ලවත්ත, කොළඹ 06.
දුරකථන අංක : 011 2581901

යෞවුන් හදවතට

# පුතුන් සත්දෙනා සහ කෝටු මිටිය.



අද මම මේ තරුණ පුතාලට දුවලට කියලා දෙන්න යන කතාව සමහරවිට ඔයාලා මීට කලින් අහලත් ඇති. අපට මේ කතාවෙන් ලොකු ආත්මික පාඩමක් ලබාගන්න තියෙන නිසා මම ඒ කතාව කියා දෙන්නම්.

ඔන්න එක තාත්තා කෙනෙකුට පුතුන් හත් දෙනෙක් හිටියා. මේ පුතාලා අතරේ කිසිම සමාදානයක් තිබුණේ නෑ. නිතරම දබර වෙනවා. මේ ගැන තාත්තා හුඟක් කණගාටු වෙනුයි සිටියේ. ඉතිං දවසක් තාත්තා පුතාලට කතා කරලා කීවා එක් එක්කෙනා ලී කෝටු එක බැගින් ගේන්න කියලා. පුතාලා ලී කෝටුව බැගින් අරගෙන ආවා. ඊලඟට කීවා ඒ කෝටු එකට තියලා ගැටගහන්න කියලා. ගැට ගැසුවාට පසුව ඒ කෝටු මිටිය මැදින් කඩන්න පුලුවන් කාටද කියලා තාත්තා ළමයින්ට කීවා. හත්දෙනාගෙන් කාටවත්ම ලී මිටිය කඩන්න තියා නමන්නවත් බැරි වුණා.

දැන් ආයිත් මිටිය ලිහලා එකිනෙකා ලීය බැගින් අරගෙන එක එක ලීය කඩන්න කියලා තාත්තා කීවා. ඉතා පහසුවෙන් එක් එක්කෙනා තම තමාගේ ලීය මැදින් කැඩුවා. තාත්තා පුතාලට කීවා අන්න ඒ වගේ පුතාලා සමාදානයෙන් එකට එකතුවෙලා වැඩකරන්න ඕනෑ, කියලා. ලෝකාලෝකය කියවන තරුණ පුතාලා දුවලටත් මම එම තාත්තාගේ අවවාදයමයි දෙන්නේ. එකට එකතුවෙලා සමාදානයෙන් වැඩ කරන්න තරුණ කාලෙම හිතට ගන්න බලන්න. මී මැස්ස පුංචි සතෙක්, ඒ වුණත් මී මැස්සෝ රංචුවක්ට එකට එකතුවෙලා මල් පැණි ටික ටික ගෙනල්ලා ලොකු මී වදයක් හදනවා. මී පැණි ඉතාම හොඳ ඖෂධයක්. අපි එක්සත් වෙලා වැඩ කළාම ප්‍රයෝජනය තිබෙන්නේ අනිත් අයට වෙන්න පුලුවන්. එය අපට ප්‍රීතියක්ය. එය ඔබ දෙවියන්වහන්සේට කරන සේවයක් මෙන් සිතන්න.

**මනුෂ්‍යයන්ට නොව ස්වාමීන්වහන්සේට මෙන් කැමැත්තෙන් මෙහෙකරපල්ලා (එපීස 6:8).**

**නොකඩවා යාච්ඤා කරපල්ලා (1 තෙසලෝනික 5 : 17).**

**"සහෝදර ප්‍රේමයෙන් එකිනෙකාට ස්නේහවෙයල්ලා" (රෝම 12:10).**

**- ජීවන හඬ -**

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දේවත්වයේ අනේකාලංකාර

**"අන්න, දෙවියන්වහන්සේගේ බැටළු පැටවාණෝ" - යොහාන් 1 : 36**

**"අන්න, ලෝකයේ පාපය දුරු කරන දෙවියන්වහන්සේගේ බැටළු පැටවාණෝ" - යොහාන් 1 : 29**

**ගීතාවලිය 27 : 4** සඳහන් දාවිත් රජතුමාගේ හදවතේ ආශාව **"ස්වාමීන් වහන්සේගෙන් එක දෙයක් ඉල්ලමි, ඒක සොයන්නෙමි, එනම් ස්වාමීන්ගේ අලංකාරය දකින පිණිසත්...."**

වර්තමාන ලෝකයේ ජීවත් වන දෙවියන්වහන්සේගේ දරුවන් වන අප යේසුස්වහන්සේගේ අනේකාලංකාරය දැක ගැනීමට වඩ වඩා ආශා කල යුතු අතර ඒ සඳහා වෙහෙස විය යුතුය. යක්ෂයා විසින් ලෝකයේ හා එහි තාවකාලික අලංකාරයට ඇදහිලිවන්තයින් ආකර්ශනය කරමින් සිටියි. මෙම පරීක්ෂාවෙන් අප ජයගත යුතුව ඇත.

අද අප යේසුස්වහන්සේගේ දේවත්වයේ අනේකාලංකාර ලක්ෂණ වලින් එකක් වන **"දෙවියන්වහන්සේගේ බැටළු පැටවාණෝ "** දෙස බලමු.

**රෝම 3:23,** සඳහන් වන්නේ සියල්ලෝ පව්කරුවෝ බවය. එමෙන්ම සියලු මනුෂ්‍යයන්ගේ හෘද සාක්ෂියද තමා පව්කරුවකු බව සාක්ෂි දරණු ඇත. එසේ නම් මනුෂ්‍ය සංහතිය සතු පාපයට විසඳුම් කුමක්ද? එය මනුෂ්‍යයා ඉදිරිපත් කරන විසඳුමක්ද? එසේ විය හැකිද? පව්කරුවාගේ ඉරණම කුමක්ද? මනුෂ්‍යයාට තම පාපය තමා විසින්ම පහකර ගත හැකිද? පාපයේ කුලිය මරණය බව **රෝම 6 : 23** සඳහන්ව ඇත. මනුෂ්‍ය සංහතියේ පාපය නැමති ප්‍රශ්ණයට බයිබලය ඉදිරිපත් කරන විසඳුම වන්නේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේය. එය සදාකාල විසඳුමකි.

## යේසුස්වහන්සේම ස්වෙච්චාවෙන් ඉදිරිපත්වීම.

**යෙසායා 6 : 8 "එවිටඃ මම කවරෙකු යවම්ද? අප උදෙසා යන්නේ කවුදැයි කියන්නාවූ ස්වාමීන්වහන්සේගේ හඬ මට ඇසුණේය. මමදඃ මෙන්න මම මෙහිය; මා යැවුව මැනවයි කීමි".**

ඉහත බයිබල් පදය සැළකෙන්නේ ස්වර්ගයේ සදාකාල අතීතයේදී සිදුවූ සාකච්ඡාවක් ලෙසය. පියාණන්වහන්සේ සහ පුත්‍රයාණන්වහන්සේ හා ශුද්ධාත්මයාණන්වහන්සේ අතර සිදුවූ මෙම සාකච්ඡාවේදී මනුෂ්‍ය සංහතිය කෙසේ ගලවාගනිම්ද? කවුරුද එය කරන්නේ? වැනි කරුණු සාකච්ඡාවට භාජනය වන්නට ඇතැයි බොහෝ අය සිතයි. එහිදී පුත්‍රයාණන් වහන්සේ තමා පොළවට යවන මෙන් පියාණන්වහන්සේගෙන් ඉල්ලා සිටිමින්

ස්ව කැමැත්තෙන්ම ඉදිරිපත් වූ අවස්ථාව ලෙස බොහෝ අය විශ්වාස කරති. දේව පුත්‍රයාණන්වහන්සේ මනුෂ්‍ය සංහතිය පාපයෙන් ගලවා ගැනීම උදෙසා එසේ තීරණය කරන ලදුව, **පිලිප්පි 2:5-9** සඳහන් ආකාරයට, ස්වර්ගික තේජස හැරදමා මනුෂයකු බවට පත්විය. එනම් ලෝකයේ පාපය දුරු කරන දෙවියන්වහන්සේගේ බැටළු පැටවාණන් හා පව්කරුවාගේ ආදේශකයාණෝ බවට පත් වී යේසුස් යන නම රැගෙන ළදරුවෙකු සේ ලොවට පැමිණිසේක.

## පාපය

**පාපයේ කුලිය මරණය යැයි, රෝම 6 : 23** හි සඳහන් වේ. එමෙන්ම **පාපය යනු නොපනත්කම යැයි, යොහාන් 3:4** සඳහන් වේ. එනම් පණත් කැඩීම වේ. මනුෂ්‍යයකුගේ සදාකාලය තීරණය වන්නේ පාපය නැමති සාධකය මතය. පාපය ඉතා භයානකය, විනාශකාරිය, මනුෂ්‍යයකු තම පාපයෙන් ගැලවෙන්නේ කෙසේද? එයට නියමාකාර සරල පිළිතුර බයිබලයේ **ක්‍රියා 16:32** හි සඳහන් වේ. එනම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අදහාගැනීම මගිනි. මෙය සරල පරම සත්‍යයකි. ආගමික චාරිවාරිත්‍රවලට එහා ගිය ගැඹුරු සම්බන්ධතාවයකි. එනම් පාපය ගණන් ගනු ලබන තැනැත්තා සමඟ සම්බන්ධවී පාපයේ ගිණුම අහෝසි කර ගැනීමෙනි. පාපය අහෝසි වීමට වන්දියක් ගෙවිය යුතුය. නමුත් එම වන්දිය ගෙවීම යේසුස්වහන්සේ භාරගෙන එය ඉටු කළසේක. එම සත්‍ය විශ්වාස කරන බව ප්‍රකාශ කිරීම හා පිළිගැනීම මගින් පාපය ගණන් ගන්නා බලධාරියා වන සර්වබලධාරී දෙවියන්වහන්සේ සතු තම පාපයේ ගිණුම අහෝසි කරගත හැකිය. එවිට සමාව ලැබෙනු ඇත. ජීවිතය අලුත් වී මහත් ප්‍රීතියකින් පිරී යනු ඇත.

සෑම දෙසැම්බර් 25 දිනකම ලෝකයා නත්තල නමින් සමරන්නේ මෙම සත්‍යයි. නමුත් නත්තල සමරන ආකාරයෙන්ම එහි පරම සත්‍ය යටපත් වී ආගමික හා වානිජමය ස්වරූපයක් මතු වෙයි. එබැවින් නත්තලේ ගැඹුරු ආත්මික සත්‍ය හා ඵල ප්‍රයෝජනය මිනිසාට මඟහැරී ගොස්ය. ලෝකයාගේ පාපය අහෝසි කිරීම පිණිස ලෝකයට ආ දෙවියන්වහන්සේ බැටළු පැටවාණන්ගේ උත්පත්තියයි. ඉතාමත් තේජාන්විතව හා ගරු ගාම්භීරව සැමරීමට ඔබටත් මටත් ආශාවක් හා කැපවීමක් දෙවියන්වහන්සේ දෙනසේක්වා.

යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ බැටළුපැටවාණෝ ලෙස විරුදාවලිය ලැබූ පසු උන්වහන්සේගේ නාමයේ අනේකාලංකාර පහත සඳහන් ආකාරයට බයිබලයේ පුරාවටත්, සදාකාල අනාගතය පුරාවටත් දිව යයි.

## බැටළු පැටවාණන්ගේ මහිමය

**01. ලෝකයේ පාපය දුරුකරනා දෙවියන්වහන්දේගේ බැටළුපැටවාණෝ (යොහාන් 1:29).**

**02. ජීවමාන සත්වයෝ සතරදෙනා සහ වැඩිමහල්ලෝ විසිහතරදෙනාත් එකිනෙකා වීණාවක්ද ශුද්ධවන්තයන්ගේ යාච්ඤා නැමති සුගන්ධ ද්‍රව්‍යයෙන් පිරුණු රන් පාත්‍රාද රැගෙන, බැටළුපැටවාණන් ඉදිරියෙහි වැඳ වැටුණෝය (එළිදරව් 5:8).**

03. මරනු ලැබූ බැටළුපැටවාණෝ බලයත් ධනයත් ප්‍රඥාවත් පරාක්‍රමයත් ගෞරවයත් තේජසත් ප්‍රශංසාවත් ලබන්ට වටින තැනන්වහන්සේයයි මහත් හඬකින් කීවෝය (එළිදරව් 5:12).

04. තවද ස්වර්ගයෙහිත් පොළොවෙහිත් පොළොවෙන් යට සහ මුහුද පිටත් ඇත්තාවූ සියලු මැව්ලි වන එහි ඇති සියල්ලෝ: සිංහාසනයෙහි වැඩ ඉන්න තැනන්වහන්සේටත් බැටළුපැටවාණන්ටත් ප්‍රශංසාවද ගෞරවයද මහිමයද පරාක්‍රමයද සදාකාලේටම වේවායි කියනවා ඇසීමි (එළිදරව් 5:13).

05. ඉන්පසු සියලු ජාතීන්ගෙනුත් ගෝත්‍රවලිනුත් සෙනඟගෙනුත් භාෂාවන්ගෙනුත් කිසිවෙකුට ගණන් කළ නොහැකි මහත් සමූහයක් සුදු සළු පැළඳ, තමන්ගේ අත්වල තාලපත්‍ර ඇතුව, සිංහාසනය ඉදිරියෙහිත් බැටළුපැටවාණන් ඉදිරියෙහිත් සිටිනවා දුටිමි (එළිදරව් 7:9).

06. ඔවුහූ සිංහාසනයෙහි වැඩහිඳින අපේ දෙවියන්වහන්සේටත් බැටළුපැටවාණන්ටත් ගැළවීම අයිතිය කියා මහත් ශබ්දයකින් හඬගැසුවෝය (එළිදරව් 7:10).

07. මක්නිසාද සිංහාසනය මැද සිටින බැටළුපැටවාණෝ ඔවුන්ගේ එඬේරාවී, ජීවන දිය උල්පත්වලට ඔවුන් ගෙනයනසේක. දෙවියන්වහන්සේද ඔවුන්ගේ ඇස්වලින් සියලු කඳුළු පිසදමන සේකැයි කීවේය (එළිදරව් 7:17).

## බැටළුපැටවාණන් සතු මහිමාන්විත දේවල්

01. බැටළුපැටවාණන්ගේ උදහස (එළිදරව් 6:16).
02. බැටළුපැටවාණන්ගේ ලේ (එළිදරව් 7:14/12:11).
03. බැටළුපැටවාණන්ගේ ජීවන පොත (එළිදරව් 13:8).
04. බැටළුපැටවාණන්ගේ ගීතිකාව (එළිදරව් 15:3).
05. බැටළුපැටවාණන්ගේ සරණමංගල්‍ය (එළිදරව් 19:7).
06. බැටළුපැටවාණන්ගේ මංගල්‍යය භෝජන සංග්‍රහය (එළිදරව් 19:9).
07. බැටළුපැටවාණන්ගේ යුද්ධය (එළිදරව් 17:14).
08. බැටළුපැටවාණන්ගේ මනමාලී (එළිදරව් 21:9).
09. බැටළුපැටවාණන්ගේ ප්‍රේරිතයින් දොළොස් දෙනා (එළිදරව් 21:14).
10. බැටළුපැටවාණන්ගේ සිංහාසනය (එළිදරව් 22:1).

මනුෂ්‍ය සංහතියේ පාපය දුරු කළ යේසුස්වහන්සේ පිළිබඳ මෙම නත්තල් සමයේ අලුත් ආකාර අවබෝධයක් හා එළිදරව්වක් ඔබත් ලබාගෙන, උන්වහන්සේට සැබෑ නමස්කාර කරන්නෙකු හා අනුගාමිකයකු බවට පත් වන්න. ඔබ සැමට සුභ නත්තලක් හා නව වසරක් වේවා!

- සංස්කාරක -

**එස්. මෙත්තානන්ද**

**077 8813197**

# පරණ ගිවිසුම එළිදරව් කරන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ



## ආහාර පූජාව
## ලෙවිකතාව 2 : 1 - 16

ජීවත්ව සිටින ක්‍රිස්තුස්වහන්සේගේ චරිතය විදහා දක්වන පරණ ගිවිසුම් චාරිත්‍රයකි මෙම ආහාර පූජාව. මෙයින් අපට ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතය පිළිබඳව බොහෝ කාරණා උගත හැකිය. පරණ ගිවිසුම් කාලයේ දී දිනපතාම මෙම ආහාර පූජාව ඔප්පු කරන ලදී. වර්තමාන නව ගිවිසුම් ඇදහිලිවන්තයාට මෙවැනි පූජා ඔප්පු කිරීමක් නැත. එහෙත් ඔවුන්ට දිනපතාම ක්‍රිස්තුස්වහන්සේගේ චරිත ගුණාංග අනුගමනය කිරීමට තිබේ. පරණ ගිවිසුම ආහාර පූජාවට ගන්නා ද්‍රව්‍ය හා එය සූදානම් කරන ආකාරය දෙස බලා ඊට අදාලව ආත්මික අර්ථය අප තේරුම් ගැනීමට උත්සහයක් දරමු.

## 01. සිහින් පිටි
### (යේසුස්වහන්සේගේ සමබර චරිතය)

ආහාර පූජාවට යොදාගත්තේ සිහින් පිටිවලින් සෑදූ ආහාරයකි. මෙම සිහින් පිටි වූ කෑලි සෑම පිටි අංශුවක්ම එක ප්‍රමාණයන් හා සිහින්ය. හලනයකින් හලා ගන්නා පිටි එය ප්‍රමාණයෙන් එක සමානය. මෙයින් අපට පෙන්නුම් කරන්නේ උන්වහන්සේගේ චරිතයේ, ජීවිතයේ, ක්‍රියාවෙනි. සෑම දිශාවටම පෙන්නුම් කරන සමබරතාවයයි.

## 02. තුවරලා දැවීම (සුවඳ ද්‍රව්‍ය)
### (දෙවියන්වහන්සේ උදෙසා ජීවත්වීමේ චරිතය.)

මෙහිදී මෙම සුවඳ ද්‍රව්‍ය දවනු ලැබේ. එවිට සුවඳ අහසට නගී. එම සංසිද්දිය අපට පෙන්නුම් කරන්නේ යේසුස්වහන්සේ හැම විටම පියාණන්වහන්සේ ප්‍රසන්න කිරීම උදෙසා ක්‍රියා කිරීමයි. ඔබත් සුභාරංචි පොත කියවා මෙම කාරණය සොයා බලන්න. යේසුස්වහන්සේ තම ජීවිතය පුරාවට ටික ටික අන් අය උදෙසා දැවී ගියේය.

## 03. මුහුන් මිශ්‍ර නොකිරීම
### (කිසි පාපයක් රහිත චරිතය)

ආහාර පූජාවට මුහුන් නොහොත් ඊස්ට් මිශ්‍ර නොකරයි. මුහුන් වලින් බයිබලය අදහස් කරන්නේ පාපයයි. යේසුස්වහන්සේට පාපය ඇතැයි කිසිවෙකුට ඔප්පු කිරීමට නොහැකි විය. උන්වහන්සේගේ ජීවිතයේ කිසියම් පාපයක් තිබුණේනම් එය මේ වන විටත් මනුෂ්‍යයන් විසින් ඔප්පු කරනවා අනිවාර්‍යයයි. යේසුස්වහන්සේ ගේ

ජීවියතය පාප රහිත විය. ඒ නිසාමයි පව්කාරයන් උදෙසා පාප පූජාවක් බවට පත්වීමට හැකියාව ලැබුණේ.

## 04. මී පැණි නොදැමීම

**(ස්වභාවික ප්‍රීතිය හා මිහිරියාව නොමැති චරිතය)**

ස්වාමිකව හා මනුසාකාර ප්‍රීතියට නොව ආධ්‍යාත්මික හා සිතේ ගැඹුරෙහි ප්‍රීතිමත් භාවයෙන් යේසුස්වහන්සේ දිවි ගෙවීය. දෙවියන්වහන්සේගේ කැමැත්ත කිරීමෙන් හා කීකරුවීමෙන් ලැබෙන ප්‍රීතිය වැනි ප්‍රීතියකින් උන්වහන්සේ ප්‍රීතිමත් විය.

## 05. තෙල් මිශ්‍ර කිරීම, වත්කිරීම හා ගැල්වීම.

**(ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වූ චරිතය)**

බයිබලයේ තෙල් වලින් අදහස් කරනුයේ ශුද්ධාත්මයාණන්වහන්සේය. යේසුස්වහන්සේගේ ජිවිතය හා චරිතය ශුද්ධාත්මයාණන් ක්‍රියා කිරීම පිටතින්, ඇතුලතින් හා සෑම පැතිකඩකින්ම පූර්ණව තිබුණේය.

### යේසුස්වහන්සේගේ ජීවිතයේ ශුද්ධාත්මයාණන්ගේ ක්‍රියා කිරීම.

★ ශුද්ධාත්මයාණන් කරණකොටගෙන පිළිසිඳගැනීම **(ලූක් 1:55)**.

★ ශුද්ධාත්මයාණන්වහන්සේ යේසුස්වහන්සේ මතට වැඩම කිරීම **(ලූක් 3:15)**.

★ ශුද්ධාත්මයාණන්වහන්සේගේ පූර්ණව සිටීම **(ලූක් 4:1)**.

★ ශුද්ධාත්මයාණන් කරණකොටගෙන ගෙන යනු ලැබීම **(ලූක් 4:1)**.

★ ශුද්ධාත්මයාණන් කරණකොටගෙන දෙවියන්වහන්සේට සේවය කිරීම **(ලූක් 4:18)**.

★ ශුද්ධාත්මයාණන් කරණකොටගෙන දෙවියන්වහන්සේට පූජාවීම **(හෙබ්‍රෙව් 7:14)**.

★ ශුද්ධාත්මයාණන් කරණකොටගෙන ජීවත්කරනු ලැබීම (මළවුන්ගෙන් නැගිටවනු ලැබීම) **(1 පේත්‍රුස් 3:16)**.

## 06. ගින්නේන් පිලිස්සීම.

**(දුක්විදීම් වලින් පූර්ණ චරිතය)**

★ ඇතිලියේ පිලිස්සීම යනු මනුෂ්‍යයන් විසින් දුටු යේසුස්වහන්සේගේ දුක් විදීමයි (මතෙව් 27:27-31).

★ උදුනෙහි පිලිස්සීම යනු මනුෂ්‍යයන් විසින් තම පියව් ඇසින් නොදැක්කා වූ යේසුස්වහන්සේගේ ඇතුලාන්තයේ දුක් විදීමයි (මතෙව් 27:45-46 / මතෙව් 26:38)

## 07. ආරොන් හා පුත්‍රයන් විසින් අනුභව කිරීම.

**(යේසුස්වහන්සේගේ චරිතය මෙනෙහි කිරීමෙන් ආත්මිකව පෝෂණය වීම)**

ආහාර පූජාවෙන් ඉතිරිවන කොටස පූජකයා ආහාරයට ගැනීම සිදුවේ. වර්තමානයේ සියලු ඇදහිලිවන්තයෝ දෙවියන්වහන්සේගේ පූජකයෝය **(1 පේත්‍රුස් 2:9)**. යේසුස්වහන්සේගේ චරිතය මෙනෙහි කිරීම මගින් වර්තමාන දෙවියන්වහන්සේගේ පූජකයන් වන ඇදහිලිවන්තයන් හට ආත්මිකව පෝෂණය වී ශක්තිමත් විය හැක.

**- නෙවිල් ජයසුන්දර -**

බයිබල් පන්තියක් ඇසුරෙනි

**බයිබලයේ රජවරු**

# සතියකට රජ වූ සිම්රි

බාෂාගේ පුත්‍ර වූ ඒලා දෙවසරක් රජකම් කළ අතර ඔහු බීමත්ව සිටියදී රජුගේ රථ කොටසක් බලා ගත් සේවකයකු වූ සිම්රි රජුට පහරදී ඔහු මරා රජකම පැහැර ගත්තේය - (**1 රාජාවලිය 16:8-10**). මත් පැන් පානයට ඇබ්බැහිවීමේ අනිෂ්ඨ විපාක දරා ගෙන විනාශ වූයේ ඒලා පමණද? "පියා විසින් පුතාට පහරදී ඔහු මරා දමයි" "පුතාගේ කෙටේරි පහරින් අම්මා මරු දකී" "එකට මත් පැන් බී මිතුරා මරා දමයි" "මත් පැන් බී දුම්රියට පනී" මෙබඳු පුවත් වාර්තා අපට හොඳින් හුරුය. පවුල් දෙකඩවීම්, නඩු හබ, මාරාන්තික තුවාල, ලේ වැගිරීම්, රිය අනතුරු වැනි බොහෝ දේට මූලික වන්නේ මත්පැන් නොවේද? ශුද්ධ ලියවිල්ල මත්පැන් හා බේබදුකම හෙලා දකී. මත්පැන් හා බේබදුකම විසින් ශුද්ධ ලියවිල්ලද හෙලා දකී. **(හිතෝපදේශ 20:1, ලෙවි 10:9, හොෂෙයා 4:11, යෙසායා 5:23 හා 5:11)** කෙසේ හෝ ඒලා රජු බීමත්ව සිටියදී තිර්ශා මාලිගයේ අරිශාගේ ගෙදර දී සිම්රි විසින් පහර දී මරා දැමීය. ඊළගට සිම්රි ඊශ්‍රායෙල්හි රජ විය.



## සමූල ඝාතනයක්.

කලකට ඉහතදී බංගලාදේශ් හී ප්‍රථම අග්‍රාමාත්‍යවරයාව සිටි ෂික් මුජිබුර් රහුමාන් කුමන්ත්‍රණයකින් මරා දැමූ මොහමද් එර්ෂාද් සෙනෙවියා කළේ මුජිබර්ගේ වැලගිය - අලගිය ලොකු කුඩා සියල්ලන් ඝාතනය කිරීමය. ඔහු එයින් බලාපොරොත්තු වූයේ තමා කළ දේ යම් දිනක තමාට සිදුවීමෙන් කල්තබාම ආරක්‍ෂා වීමය. සිම්රිද මෙය මෙසේම කළේය. ඊශ්‍රායෙල්හි රජව සිටි තමා අතින් මැරුම් කෑ ඒලාගේ කුඩා දරුවා පටන් වැඩිමහල්ලා දක්වාද ඒලාගේ පියවූ බාෂාගේ නෑදෑ හිතමිතුරන් ද පමණක් නොව ඒලාගේ මිතුරන් පවා සමූල ඝාතනය කිරීමට සිම්රි ප්‍රමාද නොවීය. ඔහු විසින් ඒලාට කල දේ ඒලාගේ හිතවතකු - දරුවකු අතින් තමාට සිදු නොවන පිණිස ඔහු වගබලාගත් නමුත් ස්වාමීන්වහන්සේ සිම්රි ගැන ද සිනාසෙන්නට ඇත. මන්ද තමාගේ ආරක්ෂාව දැඩි කරගන්නා ඉක්මණින්ම විනාශවන බැවිනි. ( **1 රාජාවලිය 16:11-12**)

සිම්රි සිංහාසනාරූඪවූ වහාම මෙම අපරාධය කිරීමෙන් අනාගතවාක්තෘවූ යෙහු විසින් කී අනාගතවාක්‍ය ඉටු විය. බාෂාගේ පරපුරම ඉක්මණින් වඳවී යන බව යේහු අනාගතවාක්‍යය පළකර තිබිණ. ස්වාමීන්වහන්සේගේ මාර්ග අත්හැර තමාට රිසිවූ මාර්ග යක යන්නාගේ විනාශය ඉක්මන් වෙයි. **(1 රාජාවලිය 16:7, 1 සමඟ රාජාවලිය**

**16:12-13 සසඳා බලන්න. හිතෝපදේශ 16:25 කියවන ලෙස මම ඔබට යෝජනා කරමි).**

තිර්ශාහීදි දින 7ක් රජ වී බලය තහවුරු කරගත් සිම්රි වසර 70වක් ඉදිරියෙන් හෝ තමාට විරුද්ධව සතුරෙකුගේ සෙවනැල්ලක් නොදකින්නට ඇත. එහෙත් සතුරා ඔහුට ලංවම සිටියේය. **"තමාගේ ජීවිතය ආරක්‍ෂා කරගන්නාට ඒක නැති වේ. මා නිසා තමාගේ ජීවිතය නැති කර ගන්නාට ඒක සම්භවේ".** යයි ස්වාමීවූ යේසුස්වහන්සේ කියන සේක **(මතෙව් 10:39).**

පිලිස්තිවරුන්ට එරෙහිව ගිබ්බෙටෝන්හි කඳවුරු බැඳගත් ඊශ්‍රායෙල්වරුන් අතරේ සේනාධිපතියා වශයෙන් ඔම්රි නැමැත්තෙකු බලවත් විය.

## එක සිහසුනයි - රජුන් දෙන්නයි

ගිබ්බෙටෝනිහි දී කඳවුරු බැඳගත් ඊශ්‍රායෙලිතයන් අතරෙහි රජව සිටි සිම්රි පිළිබඳව අප්‍රසාදයක් හට ගැණින. සිම්රි විසින් රජ මැඳුරට වැදී බීමතින් විකල්ව සිටි ඒලා මරාදැමීම ඊශ්‍රායෙල්වරු හෙලා දුටුහ. ඔවුහු පිලිස්තිවරුන්ට එරෙහිව සේනා සංවිධානය කරමින් සිටි ඔම්රි කඳවුරු තුලදීම රජ වශයෙන් පත් කර ගත්හ. මෙහිදී අප විසින් සිහි තබා ගත යුත්තේ දැන් ඊශ්‍රායෙල්ට රජමාළිගයෙහි සිම්රි ද කඳවුරු තුළ ඔම්රිද වශයෙන් රජවරුන් දෙදෙනෙකු සිටින බවය. මෙහි සැබෑ තත්ත්වය කුමක්ද? ජනතාව අරාජිතව සිටීමය. **"ස්වාමිවරුන් දෙදෙනෙකුට සේවය කරන්ට මිනිසකුට බැරිය. ඔහු එකකුට ප්‍රේමවී අනිකාට වෛර වෙයි" (මතෙව් 6:24).** ජනතාව අරාජිතව සිටියදී ඔව්හු හිතුවක්කාරකම් කරති. එහි දී ඔව්හු කරන්නේ කුමක්ද? කියන්නේ කුමක්දැයි ගණන් දීමක් නොමැති බැවින් විනාශයක්ම කර ගනිති.

ඔබේම සිත තුල පාලකයන් දෙදෙනෙක් සිටියහොත් කෙසේ වේද? දෙසිතක් ඇත්තාට යාකොබ් තුමා අවවාද කරයි. **(යාකොබ් 4:8)** ඔබ යේසුස්වහන්සේව ආගම් කතුවරයකු, යහපත් නායකයකු, ගැඹුරු දාර්ශනිකයකු, මාක්ස්වාදියකු හෝ විප්ලවකාරයෙකු ලෙස පිළිගන්නට ඉඩ තිබේ. එහෙයින් යේසුස්වහන්සේව හොඳ ස්වාමියකු ලෙස ඔබේ සිතෙහි තැන්පත් කර ගත හැකි ය. නමුත් සාතන්ද ඔබේ ජීවිතයෙන් පිටට නොයයි. ඔහුටද ඔබේ සිත නැමැති සිංහාසනය දෙපලුකර එක කොටසක් දී තිබේ. කෙටියෙන් කිවහොත් ඔබ පාළකයකුද නොවේ. ඔබ පාලිතයකු ද නොවේ. අපාලිත අරාජිකයෙකි. ඔබ පිළිගන්නා නමුත් පිළි නොපදින තුරු ස්වාමිවරුන් දෙදෙනකුට ඔබේ හදවත කැපකර සිටී. ප්‍රවේශම්වන්න!! සිම්රි හා ඔම්රි දෙදෙනාම ඊශ්‍රායෙල්ට රජවරුව සිටින අයුරු බලන්න. මෙහිදී යමක් සිදු විය යුතුය. එය නැසැකවම සිදුවිය. එක්කෝ සිම්රි, නැතිනම් ඔම්රි. ඔබගේ ගැළවුම්කරු හා ස්වාමීන්වහන්සේ ලෙසම යේසුස්වහන්සේට සිත භාරදිය යුතුය.

## සියතින්ම ගිනි තබා ගනී.

සිම්රි මාලිගයෙහි සිටියේය. ඔම්රි

කඳවුරෙහි සිටියේය. එහෙත් ඔහු නිකම් සිටියේ නැත. පිලිස්තිවරුන් විනාශ කිරීමට මුවහත් කළ කඩු, පිහියා වලින් ඊශ්‍රායෙල්හි රජවූ සිම්රි කපා කොටා දැමීමට කඳවුරෙහි ජනතාවගේ සිත් මුවහත් කිරීමට ඔම්රි සමත් විය. ඔහු ඊශ්‍රායෙල්වරුන් කැඳවා ගෙන තීර්ශා වැටලීය. පහසුවෙන්ම නගරය වටලා එය අල්ලා ගැනීමට ඔම්රි සමත් විය. සිම්රිගේ පාලනයට පහර වැදුණේ ඔහු බලාපොරොත්තු නොවූ මොහොතකදීය. නොපැතූ මඟකිනි.

ඔම්රි විසින් තීර්ශා මලිගය වටලා නගරය අත්පත්කර ගත් බව දුටු සිම්රි තමාගේ රජකම හමාර බව සාක්ෂාත් කරගත්තේය. ඔහු තමාගේ රජකම තහවුරු කර ගැනීම සඳහා පෙරින් රජව සිටි ඒලාත් ඔහුගේ වැල්ගිය - මුල්ගි ය කිරිදරුවා දක්වාත් ඝාතනය කල නමුත් විනාශය වෙනත් මගකින් පැමිණ ඔහු ඉදිරිපිට මරණයේ සෙවනැල්ල පතුරවා සිටියේය. සිම්රි බලකොටුවට ඇතුල්විය ඔහු දුටුවේ දසතින්ම රජගේ වටලා සිටින ස්වකීය ජනතාවමය. ඊශ්‍රායෙල්වරු වහසි බස් දොඩමින් පිටතට එන ලෙස තමන්ගේ පාලකයාට අභියෝග කරන්න ඇත. තමාම ආරක්‍ෂා කරගන්නා අනාරක්ෂිතව සිටින බව මා කීවේ ඒ නිසාය. ඉන්දිරා ගාන්ධි මුරකාවල් රහිතව අනාරක්ෂිතව සිටියේ නැත. ඇය දැඩි රක්ෂාවරණ මැද සිටියදි සතුරා පහර දී ගාන්ධි මහත්මිය නිහඬ කළ අයුරු අපට මතකය. තමා ගැනම නොව දෙවියන්වහන්සේ ගැනම විශ්වාසය තබන්නා වාසනාවන්තයෙකි **(ගීතාවලිය 121:5 හා 146:3).**

## මාළිගාව ආදාහනාගාරය වේ.

සිම්රි තනිවිය. ඔහු රජගෙට වැදී ඊට සියතින්ම ගිනිලා ගත්තේය. තමාම රජවී රාජසම්පත්, රාජ භෝජන, රාජවස්ත්‍ර, රාජකීර්තිය, පුරවා ගැනිමට පිළියෙල කරගත් තීර්ශා රජ මාළිගයම සිම්රිගේ මරණ උදුණ විය. රජගෙය මළ ගෙය විය. ඔහුගේ රාජ්‍යපාලනය දින හතකට සීමාවිය. **1 රාජාවලිය 16:15 සිට 20 දක්වා බලන්න.** ඔහු දෙවිවූ ස්වාමින්වහන්සේ ඉදිරියෙහි නපුරුව තිබුදේට ඇලුම්වී ඊශ්‍රායෙල් ජනතාවටද වැරදි ආදර්ශයක් ලබාදුන් නිසා මෙසේ අවාසනාවන්ත ඉරණමක් හිමිකරගත්තේය. ඔහු තමාම පව් කරමින් අපවිත්‍ර ලෙස පව්කිරීමට ජනතාවද යොමු කළේය. දින හතක් රජකම් කිරීමට තබා සිංහාසනයෙහි නිවැරදිව හිඳ ගැනීමටවත් ප්‍රමාණවත්දැයි සැක උපදී. මේ පදය දෙස අවධානය යොමන්න.

> **"ධර්මිෂ්ඨයින්ට සුභ සිද්ධවන කල නගරය ප්‍රීතිවෙයි. දුෂ්ඨයන් නැතිවන කල ඔල්වර හඬ ඇසෙයි"**
> **(හිතෝපදේශ 11:10)**

සිම්රි වෙනුවට ඔම්රි රජවිය. ඔහුගේ ඉරණම කෙසේවීදැයි අපි මීලඟට කල්පනාකරමු. එහෙත් එක අවවාදයක් පමණක් කිරීමට ඉඩ දෙන්න. ස්වාමීවූ යේසුස්වහන්සේ "රජකම්කරන" සිතක තවත් අතිරේක රජවරුන් සිටින්නට බැරිය.

**- ප්‍රන්සිස් විජයසිංහ -**

# යෝනා, ඔබ සහ මම



මහ සයුර මත යාත්‍රා කරන නැවකින් මුහුදට විසිකරනු ලැබූ මිනිසෙක් ජල දහරා අතරින් පතුළට කිඳී යයි. ඔහුගේ හිස වටා මුහුදු පන් එතී යයි. ජීවිතය පිළිබඳ බලාපොරොත්තුවක් නැති තරම්ය.

මේ මිනිසා මුහුදට හෙලනු ලැබුවේ ඔහුගේම ඉල්ලීම පරිදිය, නැව යාත්‍රා කරමින් තිබියදී හමන්නට වූ ප්‍රචන්ඩ කුණාටුවෙන් මිදීමට තිබූ එකම පියවරද එය විය. මොහු නම් බයිබලය කියවන කවුරුත් දන්නා යෝනා නැමැති මනුෂ්‍යයාය.

දෙවියන්වහන්සේ යෝනාට නිශ්චිත කාර්‍යයක් පැවරූසේක. එනම් නිනිවය නම් නුවරට පණිවිඩයක් රැගෙන යෑමයි. උන්වහන්සේ මෙසේ පැවසූසේක.

**"නුඹ නැඟිට නිනිවය නම් මහත් නුවරට ගොස් ඊට විරුද්ධව මොරගසන්න; මක්නිසාද ඔවුන්ගේ දුෂ්ටකම මා ඉදිරියට පැමිණ තිබේයයි කීසේක" (යෝනා 1:2).**

යෝනා මේ පණිවිඩය ගෙන යෑමට අකමැතිව, තර්ෂිෂ් බලා යන නැවකට ගාස්තුව ගෙවා ඊට ගොඩනැගුණේය යෝනා රැගත් නැවට වැඩිදුරක් යාත්‍රා කිරීමට ලැබුණේ නැත. ස්වාමීන්වහන්සේ මහත් කුණාටුවක් ඇති කළසේක. මේ වේලාවේ යෝනා නැවේ ඇතුළට බැස නිදාගෙන සිටියේය.

**"යෝනා නැවේ ඇතුළට බැස හාන්සිවී තද නින්දට පැමිණ හුන්නේය" (යෝනා 1 : 5).**

මෙහි යෝනා යන නම වෙනුවට ඔබේ හෝ මගේ හෝ නමත් ආදේශ වීමට ඉඩක් තිබේද? අපත් ස්වාමීන්වහන්සේගේ පණිවිඩය පැත්තකින් තබා, උන්ව හන්සේගේ වෙරලින් දියත් වෙන්නාවූ නැවක පතුලේ හාන්සිවී නින්දට වැටී සිටිනවාද? නාවිකයන් අපව අවදි කරන්නේ නැත. එහෙත් ස්වාමීන්ගේ පණිවිඩය එසේම ක්‍රියාත්මක විය යුතුව තිබේ. නැතිනම් නිනිවයේ මනුෂ්‍යයෝ පාපයෙහිම විනාශයට පත්වන්නාහ.

ආත්මික නින්දෙන් අප අවදි කරවීමට, ස්වාමීන්වහන්සේගේ වෙරළට නැවත අපව ඇද ගැනීමට උන්වහන්සේ මුහුද කළඹවන සේක. ස්වාමීන්වහන්සේගෙන් අප ඈත්වන විට මෙවැනි සැර කුණාටු අප ජීවිත හමුවට පමුණුවන සේක. අපගේ සේවය අමතක කර, පසුබටව ආත්මික නින්දට කුමක් සිදුවේද? අද නිනිවය නම් (ආත්මික වශයෙන්) පාපයේ ජීවත්වන ජන සමූහයන්ය. දුෂ්ඨකමේහිම ඔව්හූ විනාශවෙමින් සිටින්නාහ. ඒ අය සඳහා ගැළවීමේ පණිවිඩය අප අතෙහිය. ස්වාමීන්වහන්සේ අපට භාරදුන් මෙහෙය

**ඉතිරි කොටස සඳහා පිටු අංක 20, 21 බලන්න.**

# අපට පුත්‍රයෙක් දෙනලද්දේය



**කලකට පෙර ඒ බෙත්ලෙහෙමේ**
**ශුද්ධ වූ නගරේ**
**යේසුස් මෙලොවට බිහිවුනේ**
**පුංචි ගව මඩුවේ**

මෙය නත්තල් සමයේදී බොහොමයක් කිතුණුවන් විසින් ගයන ප්‍රියතම නත්තල් ගීතයකි. මේ ගීතය ඇසෙන විට මගේ සිත ළමා කාලයේ මතකය වෙත දිවයයි. මාත් මෙවැනි නත්තල් ගීත ගායනා කිරීමට බොහෝ ප්‍රිය කෙළෙමි. දෙව් බිළිඳු රජා, කලකට පෙර ඒ බෙත්ලෙහෙමේ, සීනු හඬින් ලොව පිබිදෙනවා වැනි නත්තල් ගීත ගායනා කරමින් අපි පුංචි ගව මඩුවක රෙදිවලින් ඔතන ලද පුංචි යේසු බිලිඳු තුමන් සිහිකළෙමු. බොහෝ කිතුනු නිවෙස්වල හා දේවස්ථානවල මරියතුමී හා යෝසෙප් සමග බිළිඳු යේසූතුමන් තබා ඇති ගවලෙන් ආකෘති දැකගත හැක. වසරින් වසර ලොව පුරා බොහෝ රටවල කිතුනුවන් සාම්ප්‍රදායිකව යේසු ක්‍රිස්තු බිළිඳු උපත මෙලෙස නැවත නැවත සිහිකර සතුටුවෙති. මෙලෙස නත්තල් සමයේදී අමුතුම ආකාරයේ හැඟීමකින් සිත්පුරවා ගනිති. වසර 2000කට වැඩි කාලයක් මෙය මෙලෙස සිදුවුවද, සැබවින්ම යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උපත මගින් දෙව්පියාණන් අපට ප්‍රදානය කලේ කෙබඳු කෙනෙක්ද කියා අවබෝධ කරගැනීම වඩාත් උචිතය. වැදගත්ය.

**යෙසායා 9 ඃ 6 - "අපට ළදරුවෙක් උපන්නේය, අපට පුත්‍රයෙක් දෙනලද්දේය......."** මෙම පදයට අනුව අනාගතවාක්‍යය ඉටුකරමින් ළදරුවා බෙත්ලෙහෙමේ ඉපදුනු නමුත් පුත්‍රයාණන් සදාකාලයේ සිටම සිටිසේක. පරණ ගිවිසුමේ මීකා නම් අනාග වක්තෘවරයාද උන්වහන්සේගේ උපත බෙත්ලෙහෙමේ සිදුවන බවට කී අනාවැකිය වසර 750කට පමණ පසු එලෙසම ඉටුවිය. **"නුමුත් බෙත්ලෙහෙම් එප්‍රාතා, යුදාගේ දහස් ගණන් අතරෙහි සිටීමට කුඩාව සිටින නුඹෙන්, ඉශ්‍රායෙල් කෙරෙහි ආණ්ඩුකාරයා වීමට මා වෙතට කෙනෙක් නික්ම එන්නේය, උන්වහන්සේගේ නික්මීම පුරාණයේ පටන්ද සදාකාලයේ සිටද වූයේය" (මීකා 5ඃ2)**. මේ පදයට අනුවද බෙත්ලෙහෙමේ උපන් මෙම දේව පුත්‍රයාණන් සදාකාලිකවම වැඩ සිටින බව ඔබට පසක් කරගත හැක. උන්වහන්සේ ළදරුවෙක් ලෙස මෙලොවට බිහිවීමෙන් පිළිබිඹුකරන්නේ උන්වහන්සේගේ මනුෂ්‍යයත්වයයි. මහෝත්තමයාණන්ගේ පුත්‍රයායි කියනු ලැබීම **(ලූක් 1ඃ32, 35 පද)** උන්වහන්සේගේ දේවත්වය පිළිබිඹුකරයි. නත්තල් සමයේදී කිතුණුවන් යේසූස්වහන්සේව ළදරුවෙකු ලෙස සිහි කලද දෙව්පියාණන් අප උදෙසා දුන්නේ ළදරුවෙකු නොව පුත්‍රයෙකි. **යොහාන් 3ඃ16- "මක්නිසාද දෙවියන්වහන්සේ ස්වකීය ඒක ජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේම කළ සේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහා ගන්නා සැමදෙනම විනාශ නොවී සදා කාල ජීවනය ලබන පිණිසය."**

දෙවියන්වහන්සේ ප්‍රේමයෙන් යුතුව අප උදෙසා දේවපුත්‍රයාණන් දෙනු ලැබුවේ කුමක් නිසාදැයි කරුනු බොහොමයක් දේව වචනයෙහි සඳහන්ව තිබෙන නමුත්

ඉන් ප්‍රධාන කරුණු 2ක් ඔබ ඉදිරියෙහි ගෙනහැර දැක්වමි.

**පළමුවෙනි කරුණ 1 යොහාන් 4:9 හි අපට හමුවේ.**

**"අප කෙරෙහි ඇති දෙවියන්වහන්සේගේ ප්‍රේමය ප්‍රකාශ කරනු ලැබුවේ දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් කරණකොටගෙන අප ජීවත්වන පිණිස උන්වහන්සේ ලෝකයට එවූ කාරණයෙන්ය."**

අප ජීවත් වන පිණිස දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් අප උදෙසා දුන් බව මෙම පදයෙන් අපට පැහැදිලි කරගත හැක. එසේම අපි හොඳින් දන්නා පදයක් වන **යොහාන් 3:16** හිද සඳහන්වන්නේ එම අදහසමයි. එනම් අප විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය කියාය. එහි අදහස වන්නේ අපගේ ආත්මය සදාකාලයටම ජීවත්වීම පිණිසය. මෙලොව ඉපදුනු හා ඉපදෙන සෑම දෙනාගේම ආත්මය මැරී තිබෙන බව දේව වචනය පවසයි. **(එපීස 2:1) "නුඹලා නුඹලාගේ වරද සහ පාප කරණකොටගෙන මැරී සිටි කල උන්වහන්සේ නුඹලා ජීවත් කළ සේක."** මෙසේ මැරී තිබෙන ආත්මය ජීවත්කරන පිණිස, දෙවිපියාණන්ගේ කැමැත්ත වූයේ කිසිම පාපයක් නොකලාවූ උන්වහන්සෙගේ දේව පුත්‍රයාණන් කරණකොටගෙන අපට සදාකාලික ජීවනය ප්‍රදනය කිරීමයි. සැබවින්ම සදාකාලික වූ උන්වහන්සේගේ පුත්‍රයාණන් කරණකොටගෙන පමණක්ම අපට සදාකොල ජීවනය ලැබෙන බව දේව වචනය සනාථ කරයි. **" පුත්‍රයාණන්වහන්සේ ඇත්තාට ඒ ජීවනය ඇත. දෙවියන්වහන්සේගේ පුත්‍රයා නැත්තාට ඒ ජීවනය නැත." (1 යොහාන් 5:12)**

**දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් අප උදෙසා දෙනු ලැබූ දෙවැනි කාරණය රෝම 8:29 හි සඳහන්වේ.**

**"මක්නිසාද උන්වහන්සේ පූර්වයෙන් ඇඳින ගත්තවුන් තමන්වහන්සේගේ පුත්‍රයා බොහෝ සහෝදරයන් අතරේ කුළුඳුලා වන පිණිස ඒ පුත්‍රයාගේ ස්වරූපයට සමාන වෙන්ට පූර්වයෙන් නියම කළ සේක."** මෙම පදයෙහි පූර්වයෙන් **'ඇඳින ගත්තවුන්'** යනුවෙන් අදහස්කරන්නේ ඉහත විස්තර කර තිබෙන ප්‍රකාරයට සදාකාල ජීවනය ලබා ගත් අයයි. ඒ අය දෙවියන්වහන්සේගේ දරුවන් යැයි දේව වචනය පැහැදිලි කරයි. **"නුමුත් යම් පමණ දෙනෙක් උන්වහන්සේ පිළිගත්තෝද, එනම් උන්වහන්සේගේ නාමය කෙරෙහි අදහාගත්තෝද, ඔවුන්ට දෙවියන්වහන්සේගේ දරුවන් වෙන්ට උන්වහන්සේ බලය දුන් සේක." (යොහාන් 1:12)**


දෙවියන්වහන්සේගේ සියලුම දරුවන්ගේ කුළුඳුල් සහෝදරයා වන්නේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේයි. **(රෝම 8:29)** මෙම පදයේ සඳහන් පරිදි උන්නවන්සේගේ සෑම දරුවෙකුම යේසුස්වහන්සේගේ ස්වරූපයට සමාන වීම දෙවියන්වහන්සේගේ අභිප්‍රායයි. එසේ සමාන වන්නේ කේසේද? බාහිර ස්වරූපයෙන්ද? කිසිසේත්ම එසේ විය නොහැක. දෙවිපියාණන්වහන්සේට අවශ්‍ය කරන්නේ අප යේසුස් ක්‍රිස්තුවහන්සේගේ චරිත ස්වරූපයට එනම් ආත්මිකලෙස උන්වහන්සේගේ සම්පූර්ණ උස මහතේ ප්‍රමාණයට වර්ධනය වීමයි. **"එසේ දුන්නේ ඇදහීමේද දෙවියන්වහන්සේගේ පුත්‍රයා දැනගැනීමේද එකමුතු කමටත්, සම්පූර්ණ පුරුෂ කමටත් ක්‍රිස්තුස්වහන්සේගේ සම්පූර්ණ උස මහතේ ප්‍රමාණයට අප සියල්ලන් පැමිණෙන තෙක්"........... (එපිස 4:12)**. අප එම ස්වරූපයට සමාන වෙන්ට දෙවියන්වහන්සේ පූර්වයෙන්ම නියම කර තිබෙන බව **රෝම 9:29** කියවන ඔබට වටහාගත හැක. මෙම පදය නැවත නැවත කියවා දෙවියන්වහන්සේගේ අභිප්‍රාය කුමක් දැයි හොඳින් අවබෝධ කරගන්නා ලෙස ඉල්ලමි. දේව පුත්‍රයාණන්ගේ ස්වරූපය කෙබඳුදැයි සුභාරංචි පොත් සතර කියවන විට ඔබට තේරුම්ගත

හැක. උන්වහන්සේගේ ඉගැන්වීම් තුලින් සහ උන්වහන්සේ ජීවත් වූ ආදර්ශමත් ජීවිතය තුලින් එම ස්වරූපය සරලවම ප්‍රකාශ වෙයි. **"මොහු මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාය මොහු කෙරෙහි ඉතා ප්‍රසන්නව සිටිමි"** කියා දෙවියන්වහන්සේම සාක්ෂි දැරූ සේක. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීම් අතුරින් කන්ද උඩ දේශනය ඉතා කීර්තිමත්වේ. මනුෂ්‍යයා සමග අප ක්‍රියා කල යුතුතේ කේසේද කියාත් ප්‍රතිචාර දැක්විය යුත්තේ කේසේද කියාත් උන්වහන්සේ එම දේශනයෙන් පැහැදිලි කල සේක. එකට එක කිරීම සහ පළිගැනීමේ චේතනාව වැනි දෑ අතහැර ප්‍රේමයේ හා කරුණාවේ මාර්ගයට පිවිසෙන ලෙසට උන්වහන්සේ අපට ඇරයුම් කරනසේක. උන්වහන්සේ එසේ ඉගැන්වූවා පමණක් නොව ඉගැන්වූ දේ ක්‍රියාවෙන්ද පෙන්වූ සේක. දේව පුත්‍රයාණන්ගේ ස්වරූපය මෙයයි. දෙවිපියාණන්වහන්සේ අපගෙන් බලාපොරොත්තුවන්නේද මෙම ස්වරූපයයි. නමුත් අද කිතුණුවන් වන අපට තිබෙන ප්‍රශ්නය නම් ආගමිකව ජීවත්වීමට කැමැත්ත දැක්වීමයි. ගැළවීම ලැබූ ඇදහිලිවතුන් බව පෙන්වමින් කිතුණු සභාවක සාභාභාගි කම් පැවැත්වීමට, බයිබලය කියැවීමට, ගීතිකා ගායනා කිරීමට, යාච්ඤා කිරීමට හා සේවය කිරීමට පුරුදුවී සිටිමු. ඇදහිලිවතුන් මේවා කිරීම වරදක්යැයි මා කියන්නේ නැත. අවංකවම මුළුසිතින් අපි මේ දේවල්වල නිරත විය යුතුයි. නමුත් එවැනි ජීවිතරටාවකට පුරුදු වී අප අප ගැනම තෘප්තිමත්භාවයට හෝ සෑහීමකට පත් නොවිය යුතුයි. බාහිර ලෙස මෙසේ කරමින් අපි හොඳ භක්තිවන්තයන් යැයි සිතමින් අපවම රවටා ගන්නෙමු. අපගේ ඇතුලාන්ත චරිතයේ ආත්මික ලෙස වෙනසක් සිදුවීනැත්නම්, එනම් ක්‍රිස්තු චරිතය හෝ ස්වරූපය නැත්නම් ඉහත සඳහන් දේවල් කිරීමෙන් දෙවිපියාණන්ව කිසිසේත් ප්‍රසන්න කළ නොහැක. අපි තවමත් ඊර්ෂ්‍යා කරමින්, ද්වේශකරමින්, කෝපවෙමින්, ඕපාදූප කතාකරමින්, බොරු කියමින්, වංචා කරමින්,අන් අයගේ වැරදිම සොයමින් ජීවත්වෙනවානම් අපි තවමත් වෙනස් වී නොමැත. ක්‍රිස්තුස්වහන්සේගේ සවරූපයට දශමයකින්වත් සමාන වී නැත. මෙවන් අය කිතුණුවන් යැයි කියාගැනීම ගැළපෙන්නේද නැත.

ප්‍රිය සහෝදර සහෝදරිය මේ ගැන සිතන්න. විශේෂයෙන්ම නත්තල් සමය යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උපත සමරමින් සිත් පිනවන හැඟීම්වලින් මනස පිරී පවතින කාල වකවානුවකි මෙය. නමුත් සැබෑ ඇදහිලිවතුන් ලෙස අපි ඉන් ඔබ්බට උන්වහන්සේව සැමරිය යුතුයි. ක්‍රිස්තුස්වහන්සේ සැමරීම යනු උන්වහන්සේගේ ජීවිත ආදර්ශය මගින් අපගේ ජීවිත වෙනස්කර ගැනීමයි. අපට පුත්‍රයෙක් දෙනලද්දේ ඒ නිසාය. **(යෙසායා 9:6)** දෙවිපියාණන්ගේ කැමැත්ත නම් එම පුත්‍රයාණන් කරණකොටගෙන අපවද පුත්‍රයන් හැටියට තේජසට ගෙන යාමයි. **"කුමක් හෙයින්ද යමෙකු නිසාත් යමෙකු කරණකොටගෙනත් සියල්ල පවත්නේද, ඒ තැනන්වහන්සේ විසින් බොහෝ පුත්‍රයන් තේජසට ගෙන යන කල ඔවුන්ගේ ගැළවීමේ කතෘන්වහන්සේගේ දුක් විඳීම කරණකොටගෙන සම්පූර්ණ කරන්ට යුතු වූයේය."(හෙබ්‍රෙව් 2:10).** මෙම නත්තල් සමයේදී ගෙවී ගියාවූ වසරවල මෙන් ගවලෙනක සිටින ළදරු යේසූ බිළිඳා සමරමින් සිටින ළදරු ගති අතහැර දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් නමදිමින් සිහිකරමින් උන්වහන්සේගේ ස්වරූපයට සමාන වෙන්ට සිතට ගනිමු. සැබෑ ඇදහිලිවන්ත පුත්‍රයන් දූවරුන් වෙන්ට කැපවෙමු. **"ඒ පුත්‍රයාණන්වහන්සේ මාංසාකාරයෙන් දාවිත්ගේ වංශයෙන් ඉපිද, ශුද්ධකමේ ආත්මයේ ප්‍රකාරයට දේව පුත්‍රයාණන් හැටියට මළවුන්ගෙන් නැගිටීම කරණකොටගෙන බලයෙන් යුක්තව ප්‍රකාශකරනු ලැබූසේක" (රෝම 1:5).**

**- ඈන් ජයසුන්දර -**

# පැනීම.



පැනීම වූ කලී හාවා, කැන්ගරුවා, පොළඟා යන්නවුන්ට පමණක්ම කළ හැකි දෙයක් නොවන බව කොයිකාටත් තේරුම් යන්නේ පැනීමට උපන් හපන් අය මිනිසුන් අතරද සිටින නිසාය. "*පනින්න පෙර සිතා බලන්න*" යනුවෙන් බාල මහලු හැම කෙනෙක්ම නිතර කියන කියමනක් වුනත්, එය අද ජන වහරේ පවතින කිසිම වටිනාකමක් නැති ශූන්‍ය ප්‍රකාශයකි. බොහෝ අය අද සිතන්නට පටන් ගන්නේ පැන්නාට පසුවය. සිත සිතාම අඬ අඬාම මරුවැලට පනින අය දකින විට අපටද විටෙක ඇඬෙන්නේය. **ලූක් 18 වන පරිච්ඡේදයේ** සඳහන් පොහොසත් යෞවනයා මීට කදිම නිදසුනක් යැයි මා සිතන්නේ ඔහු තම විනාශකාරී මාර්ගය තමන් විසින්ම තෝරාගත් එම මාර්ගය කරා ගොස් ඒ මතට ඇද වුටුනු (පැනපු) කෙනෙකු නිසාය.

තිරස් හා සිරස් වශයෙන් දෙආකාරයකට පැනීම සිදුකල හැකිය. අයෙක් සිරස්ව නොහොත් ඉහලට පැනීමට දක්ෂතාවය පෙන්නුම් කරන අතර තවත් අයෙක් තිරස්ව නොහොත් දුර පැනීමට දැඩි කැමැත්තක් දක්වති. උඩ පැනීම ඉතාම හානිකර පාපයකි. එසේ උඩ පනින අය තමන් නැවත පොළොව මත පතිත වන බව අමතක කරති. තමන් උඩ පනින විට ගුරුත්වාකර්ෂණ බලය අහස දෙසට මාරුවෙන බව ඔවුන් සිතනවා විය හැකිය. වැඩියෙන් උඩ පැන්න තරමට වැටෙන පාරත් සැර වැඩිවෙයි. තන්හාව, උඩගුව සහ තමාකම උඩ පැනීමට රුකුල්දෙන ඒජන්ත උන්නාන්සේලාය. ඉතා වේගයෙන් උඩටම පනින අය, අනේ එම වේගයෙන්ම නැවත ඇදවැටෙති. **ක්‍රියා 12:21 - 23** හෙරොද්ට අත්වූ ඉරණම කියවා බලන්න. ආදම් සහ ඒව යක්ෂයා විසින් පොලොඹවනු ලැබ දෙවියන්වහන්සේටත් වඩා ඉහලින් උඩ පැනීමට ගොස් පහතට ඇද වැටුනේ ලොවට පාපය ඇතුල් කරමිනි. ඔවුන්ගේ උපදේශකයා වන මහ යක්ෂයාද ඒ ආකාරයෙන්ම ස්වර්ගයේ සිට පහතට හෙලනු ලැබ හොට බිම ඇනගත් අයෙකි.

ලෝක ඉතිහාසය දෙස හැරී බලන විට ඉතාම ඉහලට නැගී සිටි හිට්ලර් මුසෝලිනි, වැනි කෲර කිසිවෙකුගේත් දෑස් කඳුලින් තෙත් නොකරන බව නොඅනුමානය. මෑතකදී ඇද වැටුනු එවැනි රාජ්‍ය නායකයෙකි කාම්බෝජයෙහි පොල්පොට්. දැනට දන්නාවූ අඩුම සංඛ්‍යා ලේඛන අනුව ඔහු විසින් ඝාතනය කරන ලද මිනිස් සංඛ්‍යාව ලක්ෂ 20ක් පමණ වේ. "මෙම සියවසෙහි ජීවත් වූ අවසාන, ඉතා භයංකර සත්වයා" යන විරුදාවලිය ලද පොල්පොට් ඉතාම අසරණ ලෙස, ගරාවැටුණු කුඩා කුටියක අබලන් වූ ඇඳ කබලක් මත මැරී වැතිර සිටියේය. ඔහුගේ දිරාපත්වූ සෙරෙප්පු කුට්ටමද

ඇඳ අසල විය. අපට ලැබෙන පිණිවිඩය කුමක්ද? ලොව ඕනෑම බලවත් ජගතෙකු දෙවියන්වහන්සේ ඉදිරියේ තක්සේරුවක් නැති දූවිල්ලක් බව අප සිහියේ තබාගත යුතුය.

දුර පැනීමට දක්ෂතාවය පෙන්නුම් කරන අප අතර කිතුණුවන්ද ඉදිරියෙන් සිටින බව පෙනේ. බයිබලය කියවන විට බොහෝ අය එහි සමහර පද, පරිච්ඡේද යනාදිය අතහැර දමා ගව්ගානක් දුර පැනීමට කැමතිය. එසේ කියවා මුලු බයිබලයම කියවා ඇති බව අන්‍යයන්ට කීමට බොහෝ අය කැමතිය. දේව අනුභාවයෙන් ලියැවුණු මුලු ලියැවිල්ලම ඉතාම වැදගත් වේ. අනර්ථවත් යැයි කියා බැහැර කිරීමේ කොටස් බයිබලයේ නැත. දිනපතා යාච්ඤා කරන විටදීද දුර පැනීමට සමහරු කැමතිය. යාච්ඤා කල යුතු ලැයිස්තුවේ සමහර නම් අතහැර තමන් කැමති දේවල් පමණක් තෝරාගෙන කරන යාච්ඤාව හුදෙක් ආත්මික නොව මානසික ස්වරූපයක් ගනී.

"පැනීම" යන්නෙහි නිවුන් සෙහොයුරෙකි "බැනීම". කුපිතවූ බොහෝ කිතුණුවන් පවා තම සහෝදර ප්‍රතිවාදීන්ට පැන පැන බනින්නේ, පැන පැන සපා කන සමහර සතා සිවුපාවා මෙනි. සමාව, ඉවසීම, සාමය යනාදී වචන ඔවුන්ට මතක් වන්නේ ඉඳහිට හෝ බයිබලය කියවාගෙන යන විටදී පමණකි. එහෙත්, එළඹෙන ඊලග මොහොතේදී ඔවුන් හැසිරෙන්නේ බයිබලය යන වචනය කිසිදාක ආසාවත් නැති අය මෙනි. පනින රිලවුන්ට ඉනිමං තබන්නාසේ එවැනි අයට රුකුල් දෙමින් කතාව " මැද්දට පනින අයගේ" සේවයෙන්ද සභාවේ අඩුවක් නැත. එහෙත් සභාවක් තුළ සිදුවිය යුත්තේ මෙයද? සමාදාන කරන්නෝ ආශිර්වාද ලද්දෝය **(මතෙව් 5:9).**



තවත් එක නිරර්ථක පැනීමක් ගැන සටහනක් තබා අවසාන කල යුතුයි. පාපය නිසා දෙවියන්වහන්සේගෙන් ඉවත්වී සිටින මනුෂ්‍යයා නිරන්තරයෙන්ම ශුද්ධවූ දෙවියන්වහන්සේ වෙතට පැනීමට මාන බලයි. යහපත් ක්‍රියා, පුන්‍ය කටයුතු, දන් දීම, වන්දනා ගමන් යෑම, නොයෙකුත් ආගම් පිළිපැදීමට උත්සාහ කිරීම යනාදිය මෙකී පැනීමේ නොයෙකුත් ප්‍රභේදයන්ය. එහෙත්, කනගාටුදායක දේ නම්, ඔහුගේ මෙම පැනීම කෙලවර වන්නේ පතුලක් නැති ගිනි විලකට ඇද වැටීමෙනි. දෙවියන්වහන්සේ කෙතරම් අතිශුද්ධවූ තැනැන්වහන්සේද යත් අතිශයින් පව්කාර මිනිසාට දෙවියන්වහන්සේ ප්‍රේමයෙන් යුතුව මෙලොවට සපැමිණියේ මිනිසාව නැවත දෙවියන්වහන්සේ හා සමඟ සම්බන්ධ කිරීමටය. "**මාර්ගයද, සැබෑවද, ජීවනයද මමය**" යේසුස්වහන්සේ කී සේක.

**- ඇලෙක්ස් පෙරේරා -**

# යක්ෂයාගේ විකල්ප


**නුඹලා නුඹලාගේ පියවූ යක්ෂයාගෙන්ය, නුඹලා නුඹලාගේ පියාගේ තෘෂ්ණාවන් ඉෂ්ටකරන්ට කැමතිය. ඔහු පටන්ගැන්මේ සිට මිනීමරන්නෙක්ය, ඔහු තුළ සැබෑකම නැති හෙයින් ඔහු සැබෑවෙහි නොපැවතුණේය. ඔහු බොරුවක් කියන කල තමාගේම දේ කියයි. මක්නිසාද ඔහු බොරුකාරයෙක්ය, බොරුවේ පියාය. (යොහාන් 8 :44)**

යක්ෂයා තුල සැබෑකම නොමැති හෙයින් ඔහු සැබෑවෙහි නොපවති. ඔහු බොරුවක් කියන කල තමාගේ ම දේ කියයි. මක්නිසාද ඔහු බොරු කාරයෙක්ය, බොරුවේ පියාය.

මිනිස් සංහතිය දැනට වසර 6000 පමණ මෙම පෘතුවිය මත ජීවත්ව තිබේ. මිනිසාගේ ජීවිතයට අවැසි සියලු දේ දෙවියන්වහන්සේ විසින් සපයා දී ඇත. අහසෙන් වැටෙන වැසි, පොළොවෙන් හට ගන්නා ඵල බෝග, ස්වසනය සඳහා පිරිසිදු වාතය සහ අත්‍යාවශ්‍ය හිරු එළිය යනාදී සෑම දේ දෙවියන්වහන්සේ විසින් මිනිසාට සපයා දුන්සේක. එහෙත් දෙවියන්වහන්සේ විසින් මිනිසාට සපයා දුන් ප්‍රධානතම දෙය නම් මිනිසාගේ ආත්මය ගැළවීමේ මාර්ගයයි. දෙවියන්වහන්සේගේ පුත්‍රවූ යේසුස්වහන්සේගේ ජීවිත පූජාව කරණකොටගෙන මිනිසාගේ පාපවලට සමාවත් දෙවියන්වහන්සේගේ දරුකම ලැබීමේ භාග්‍යයත් සපයා දී තිබෙන බවට බයිබලය සාක්ෂි දරයි. යථාතත්වය මෙය වුවත් එය පිළිගැනීම වෙනුවට වෙනත් විකල්ප මාර්ග හඹා යෑමට මිනිසා පෙළඹී සිටින්නේ ඇයි. ඊට සරල පිළිතුර ඉහත සදහන් කළ බයිබලීය පාඨය මගින් සපයයි. දෙවියන්වහන්සේ සපයා දී තිබෙන මාර්ගය තොරා ගැනීම වෙනුවට යක්ෂයා ඉදිරිපත් කරන සාවද්‍ය හා නිෂ්ප්‍රයෝජන වූ විකල්ප මාර්ග මිනිසා විසින් තෝරා ගෙන තිබේ. ඔහුගේ උසිගැන්වීම වනුයේ **"නුඹලා ප්‍රඥාවන්තයෝය, දෙවිවරු වාගේය මේ නිසා නුඹලාගේ ගැලවීමේ මාර්ගය නුඹලාම සපයා ගනිල්ලා"** යනුවෙනි. මෙවන් කථා ආරම්භ වූයේ ඒදන් උයනේදී බව **උත්පත්ති 3:4 - 5** පද වල සදහන්ව තිබේ. මේ මුලාව නිසාම දෙවියන්වහන්සේ මිනිසා හා සමඟ ඇතිකර ගැනීමට කැමති අලුත් ගිවිසුමක සම්බන්ධතාවය මිනිසා විසින් බොහෝ දුරට ප්‍රතික්ෂේප කර තිබේ. දෙවියන්වහන්සේ විසින් සැපයූ දේ මනාප සිතින් භාරගත්තෝ ගණනින් සුලුතරයකි. වර්තමාන ලෝකයේ යථාර්තය මෙයයි.

## විකල්ප මාර්ග.

මෙම ලිපියෙන් අප උත්සාහ කරන්නේ යක්ෂයා විසින් ඉහත කී පරිදි ඉදිරිපත් කරන ලද විකල්ප මාර්ග සමහරක් ගැන සොයා බැලීමයි. කෙටියෙන් ලැයිස්තුගත කරන්නේ නම්, ඒවා මෙසේය.



1. අදේවවාදය (මරණයේ දර්ශනවාදය)
   බයිබලීය පිළිතුර : **ගීතාවලිය 14:1**
2. පරිණාමවාදය (සියල්ලෝම අදහන බොරුව)
   බයිබලීය පිළිතුර : **උත්පත්ති 1**
3. ජ්‍යොතිෂ්‍යය (මිථ්‍යාවේ අන්ධකාරය)
   බයිබලීය පිළිතුර : **ගීතාවලිය 19:1**
4. ආගමික මතවාද (මිනිසාගේ මාර්ගය)
   බයිබලීය පිළිතුර : **හිතෝපදේශ 14:12**
5. සාවද්‍ය සුභාරංචිය (කිතුණු දහම තුළ වියවුල)
   බයිබලීය පිළිතුර : **ගලාති 1:6-7**
6. සාවද්‍ය ඇදහිලි ක්‍රම (මුලාව යන තාරකාවෝ)
   බයිබලීය පිළිතුර : **යූද් 3 හා 4**
7. පිටසක්වල ජීවීන් (මහා මුලාව)
   බයිබලීය පිළිතුර :
   **2 තෙසලෝනික 2:11,12**

ඉහත සඳහන් ලැයිස්තුවෙහි ඇති කරුණු එකින් එක ගෙන කෙටියෙන් විග්‍රහයක යෙදෙමු.

## 1. අදේවවාදය නොහොත් මරණයේ දර්ශනවාදය

## (ගීතාවලිය 14:1)

අදේවවාදය යනු දෙවියන්වහන්සේ වැඩ සිටීම යන සත්‍යතාවය ප්‍රතික්ෂේප කිරීමයි. අදේවවාදීන් හැටියට ප්‍රසිද්ධියක් උසුලන උගත් මහාචාර්‍ය්‍ය පුද්ගලයින් කිහිප දෙනෙක් වර්තමාන ලෝකයෙහි සිටිති. දෙවියන්වහන්සේ කෙනෙකු නොමැති බවට තමා තුළම ඔවුහු සහතිකභාවක් ඇති කර ගෙන සිටිති. තම භූමික ශාස්ත්‍රීය අධ්‍යාපනික සුදුසුකම් භාවිත කරමින් අදේවවාදය ප්‍රචලිත කිරීමට ඔවුන් නොදරණ උත්සාහයක් නැත. තම ප්‍රසිද්ධ දේශන තුලින් ශුද්ධ බයිබලයට පහර ගසමින් කිතුණු නායකයන් සහ දේශකයන් නිගාවට ලක් කිරීමට උත්සාහ කරති. අදේවවාදීන් සහ බයිබලීය ධර්මාචාර්‍ය්‍යවරුන් අතර ප්‍රසිද්ධ විවාද පැවැත්වීම මේ දින වල සුලභව දැකිය හැක.

කෙසේ වෙතත් මේ දේවවාද මතවාදය පිළිබඳ දෙවියන්වහන්සේගේ පිළිතුරු සෘජුය, සංශිප්තය **"අඥානයා දෙවිකෙනෙක් නැතැයි සිතින් කීය" (ගීතාවලිය 14:1).** මිනිස් අප කුමන දේ පැවසුවත් අදේවවාදය පිළිබඳව බයිබලීය තීන්දුව එනම් දෙවියන්වහන්සේගේ තීන්දුව එසේ වේ.

අදේවවාදය සත්‍යය නම් පහත සඳහන් දෑ ද සත්‍යය විය යුතු නොවේද?

01. දෙවියන්වහන්සේ නොමැති නම් හරි හා වැරදි පිළිබඳ නිගමනයක් හා ප්‍රමිතියක් ඇති කිරීමට කෙනෙකු නැත. මිනීමැරීම හොඳ යයි ඔබට සිතේ නම් එය

වැරදි යැයි නිගමන කිරීමට කිසිවෙකුට නොහැකි වේ. එහෙත් **"යහපත් වේවා, නපුරු වේවා සියලු ක්‍රියාද සියලු රහස් දේද දෙවියන්වහන්සේ විනිශ්චයට පමුණුවන සේක" (දේශනාකාරයා 12:14).**

02. තමා කරන කිසිම ක්‍රියාවක් පිළිබඳව මිනිසා කිසිවෙකුට වග උත්තර කරුවෙකු නොවේ. දෙවියන්වහන්සේගේ වැඩ සිටීම නොමැති නම්, මුලු නීති පද්ධතියේ හරයත් දුර්වල වේ. එහෙත් **දේශනාකාරයා 11:9** හි සඳහන් වන්නේ **"සියල්ල ගැන දෙවියන්වහන්සේ නුඹ විනිශ්චයට පමුණුවන බව දැනගන්න" කියාය (දේශනාකාරයා 11:9).**

03. මිනිසාගේ යම් ක්‍රියාවක් පාපයක් යයි හංවඩු ගැසීමට කිසිවෙකුට නොහැකි වේ. (මිනී මැරීම, ගබ්සා කිරීම, මත්ද්‍රව්‍ය භාවිතය, සියදිවි හානිකර ගැනීම, අසභ්‍ය දර්ශන නැරඹීම සහ තවත් එවැනි ක්‍රියා) **"සියල්ලෝම පව් කොට දෙවියන්වහන්සේගේ මහිමයෙන් හීන වී සිටිති" යයි රෝම 3:23** හි සඳහන්ව තිබේ.

04. යක්ෂයා යැයි කියා කෙනෙක්ද පාප පරීක්ෂාවක් කියා දෙයක්ද ඇත්තේ නැත. එහෙත් බයිබලයේ **1 පේත්‍රුස් 5:8** සඳහන් වන්නේ යක්ෂයා ගොරවන සිංහයකු මෙන් ඔබ මොබ ඇවිදිමින් සිටින බවය.

05. දෙවියන්වහන්සේ වැඩ නොසිටින සේක් නම්, ස්වර්ගයක් සහ නිරයක් ද තිබිය නොහැක. සියල්ල මෙහිදීම කෙලවර වේ. බලන්න මෙවැනි සිතුවිල්ල ඇති භයානක කම කොපමනද කියා. එහෙත් සැබවින්ම නිරයක් පවතින බව **යෙසායා 5:14 සහ යෙසායා 14:9** ඇතුලු බයිබලීය පද සියගණනකින් සහතික කොට තිබේ.

06. දෙවියන්වහන්සේ නොමැතිනම් මිනිසාට ආත්මයක් නැත. ඔහු සදාකාලික නොවේ. සතෙකුට සමාන වේ. අදේවවාදය මිනිසා ඇද දමන්නේ තිරිසනෙකුට වඩා ටිකක් දියුණු වූ පුද්ගලයෙකුගේ තත්වයටමයි. එහෙත් මනුෂ්‍යයාට ආත්මයක් ඇති බවත් ඔහු සදාකාලික බවත් බයිබලය පුන පුනා ප්‍රකාශ කරයි. **(1 තෙසලෝනික 5:23 / එළිදරව් 20:12).**

07. දෙවියන්වහන්සේ නොමැති නම් මේ ලෝකයේ පැවැත්මේ අර්ථ ශූන්‍ය වේ. අරමුණක් ද නැත. අහඹු ලෙස ඇති වී, අහඹු ලෙස නැති වී යන පද්ධතියකි. සියල්ලම අනිත්‍ය යයි. පවසමින් සුසුම් ලෑම පමණක් කළ හැක. එහෙත් **2 තිමෝති 1:9, එළිදරව් 21:3,** සහ තවත් බොහෝ බයිබලීය පාඨවලින් දෙවියන්වහන්සේට අප ගැන අරමුණක් තිබෙන බව පැහැදිලි වේ.

මෙම ලිපිය පිළිබඳ අදහස් උදහස් සාකච්ඡා කිරීමට අවැසි නම් කරුණාකර සංසකාරකතුමාව අමතන්න.

මතුසම්බන්ධයි.

**- නෙවිල් ජයසුන්දර -**

**11 වැනි පිටුවෙන්.... යෝනා, ඔබ සහ මම**

පසෙක ලා අප නැවේ ඇතුළට බැස නිදාසිටිමුද?

මුහුදේ කුණාටුව නැතිවීමට නම් යෝනා මුහුදට හෙළීම අවශ්‍ය බව නැවියෝ තේරුම් ගත්හ. මන්ද යෝනා මුහුදේ හෙළන්නැයි ද කියා සිටියේය. මේ සියල්ල මෙසේ සිදුවූයේ දෙවියන්වහන්සේගේ සැලසුම් කිරීමට අනුවමය. කැළඹෙන මුහුදේ දිය රළ අතරෙහි යෝනා ගිලීයද්දි කුණාටුව නතරවෙයි. ඔහු මුහුදු පතුලට කිදා බසින කළ ස්වාමින්වහන්සේ ඔහුව ගිලගැනීමට මත්ස්‍යයෙකු පත්කළ සේක. ජල දහරා අතරෙහි ඔහුට දෙවි සමිඳුන් අයැදීම අපහසු වූවක් දැන් ඔහුට ඒ සඳහා අවකාශයක් සැලසී ඇත. යෝනා වහාම පසුතැවිල්ලෙන් යාච්ඤාවක් කරයි. **(යෝනා 2)** ඔහු යාච්ඤා කරන අතර, **"ඔබගේ ශුද්ධ මාලිගාව දෙස නැවත බලන්නෙමි"** යයි පවසයි.

ස්වාමීන්වහන්සේගේ වෙරළින් අපව දුරස් කරන ලෞකිකත්වයේ නෞකාවේ ඇතුළෙහි වැතිර නිදා සිටින අප කටුක අත්දැකීම් අතර කිඳාබසින නමුත් ස්වාමීන්වහන්සේගේ කරුණාව අප අත් නොහරින සේක. එවන් ජලදහරා අතරේම ස්වාමීන්වහන්සේ දෙසට හැරීමේ අවකාශයද අපට තිබේ.

**"ඔබගේ ශුද්ධ මාළිගාව දෙස නැවත බලන්නෙමි"** කියන්නට අප අවකාශයක් ඇත. ඔහු මත්ස්‍යයාගේ කුස තුළ සිටියදී ස්වාමීන්වහන්සේ ඉදිරියේ යෝනා වරද පිළිගෙන නැවත හැරුණු විට උන්වහන්සේ ඔහුව ගොඩට ගෙනැවිත් වැමෑරීමට මාලුවාට අණකළ සේක. නැවතත් අපි ස්වාමීන් වහන්සේගේ වෙරළට පැමිණ සිටිමු. කුණාටුව තුළින්, මහත් ජල දහරා තුළින්, මත්ස්‍යයාගේ කුසින්, යලිත් ගැලවීමේ වරායට.



දෙවන වරත් ස්වාමීන්වහන්සේගේ පණිවිඩය යෝනා වෙත පැමිණේ.
**"නුඹ නැගිට නිනිවය නම් මහත් නුවරට ගොස් මා විසින් නුඹට කියන කාරණ එහි ප්‍රකාශ කරපන්න" (යෝනා 3:1).**

පළමුවතාවේ යෝනා මේ වචනවලට කීකරු වුණා නම් ඔහු ඉහත කී කටුක අත්දැකීම් තුළින් ගමන් කරන්නේ නැත. නිනිවය නගරය විශාල එකක් විය. එහි ජනතාව කෙරෙහි, ඔවුන් දුෂ්ඨව සිටියද, ස්වාමීන් වහන්සේගේ සිතෙහි වූ අනුකම්පාව එතුමන් ගේම වචන වලින් මෙසේය.

**"එක් ලක්ෂ විසි දහසකට වඩා මනුෂ්‍යයන්ද, මෘගයන්ද සිටින්නාවූ නිනිවය නම් වූ ඒ මහත් නුවර කෙරෙහි මාත් අනුකම්පා කළ යුතු නොවේද?"** යෝනා මගින් දේව පණිවිඩය ඇසූ නිනිවයේ සෙනඟ පසුතැවිලිව නිරාහාරව යාච්ඤාවේ යෙදුන අතර තම වැරදි වලින් හැරුණෝය. එම දේශය ආරක්ෂාවිය.

යම් දේශයක දුෂ්ඨකම බහුල වෙන විට, **(යෝනා 4:11)** රූප වන්දනාව පැතිරෙන විට එම දේශයට ස්වාමීන්වහන්සේගේ උදහස යොමුවේ. නොයෙකුත් විපත් ආපදාවන්ට දේශය මුහුණපායි. ස්වාමීන්වහන්සේ මෙසේ සිදු කරන්නේ

සෙනඟට පාපයෙන් හැරීමට බොහෝ කල්දීමෙන් පසුවයි. එහෙත් අවංකව ස්වාමීන්වහන්සේව අදහන අයම උන්වහන්සේ එවන් විපත්ති සමයන්හි ආරක්‍ෂා කරන බව පැහැදිළිය. මුල් කාලයේ මිනිසාගේ දුෂ්ඨකම් වැඩි වූ අතර, ඔව්හු ස්වාමින්වහන්සේ නෝවා තුළින් කළ අවවාද ගණනකට නොගත්හ. එහිදී නෝවාත්, පවුලේ අයත් හැර මුලු පොළවම ජලගැල්මෙන් විනාශ විය. සොදොම් - ගොමෝරා නගර ඇදහිලිවන්තයින් අඩුම වශයෙන් දහදෙනෙක්වත් සිටින්නේනම් විනාශ නොකරන බව ස්වාමීන්වහන්සේ වදාළ සේක. එම නගරවලට නපුරු පාපයන් නිසා විනිශ්චය ලඟාවීමට තිබුණි. දසදෙනෙක්වත් එහි අදහන්නෝ නොවූහ. ලොත් සහ ඔවුන්ගේ පවුලේ අය හැර එම නගර දෙකම ගින්නෙන් විනාශ කරනු ලැබීය. ස්වර්ගයට කැඳවා ගැනීම පිණිස මිස, නොවේ නම් ඇදහිලි වන්තයෙකු මෙවැනි විනිශ්චයකදී ආරක්‍ෂා කෙරේ.

අද අපේ මේ පුංචි දේශයද මහත් ව්‍යසනයකට පත්ව ඇත. හැම පැත්තෙන්ම විනාශයේ හඩ ඇසේ. මිනිස් ජීවිත අකාලයේ විනාශවී යයි. ස්වාමීන්වහන්සේ මෙසේ වන්නට ඉඩ හැරියේ ඇයි දැයි මනුෂ්‍යයෝ ප්‍රශ්ණ කරති.

ලංකාවේ මෑත යුගයකදී දුෂ්ඨකම අතිශයින් වැඩිවූ බව රහසක් නොවේ. නොබෝදා ප්‍රසිද්ධ පුවත් පතකින් මා දුටු කරුණක් නම්, සොදොම සහ ගොමෝරා විනාශයට හේතු වූ අන්දමේ බලවත් පාපකාරී සංවිධානයක් හෙළිවී ඇති බවයි. ලංකාව තුළ මේ විපත්ති වලට හේතුව පාපයේ බහුලත්වය විය හැකිය.

මෙවන් අවස්ථාවක අපි තර්ජිෂ්ට යන නැවට ඇතුල්වී යෝනා සමග නිදාසිටිමුද? ලංකාව පුරා පැතිරි යන විනාශයේ මාර්ගවලින් අප නැවත ස්වාමීන්වහන්සේගේ මාලිගාව වෙත හැරෙමු. අපේ පසුබටවීම්, අකීකරුවීම්, නිදිබර අලසකම්, ශුභාරංචිය දීමේ අත පසුකිරීම් ඒත්තුගනිමු. ලක්වැසියන්ගේ පාපයේ භයානකකම මෙන්ම, ඇදහිලිවන්තයාගේ ආත්මික නින්ද නිසාද මේ විනාශයන්ට උන්වහන්සේ ඉඩහැරියා විය හැකිය. කෙසේ වෙතත් දැන්වත් (**එපීස 6:10-18**) ඇදහිලිවන්තයාගේ යුද්ධායුධ පැළඳ සූදානම්ව සිටිමු. සතුරා පිටුපස නිතරම සිටින්නේ සාතන් බව අපි දනිමු. අප රටේ ශුභාරංචියේ නිදහස නැති කර, ආගාධායකත්වයේ ගොඩනැගීමට මනුෂ යාව පොලොඹවන්නේ සාතන් බවද අපි දනිමු. යේසුස්වහන්සේට සවන් දෙන්න.


**"බලව සර්පයන්ද ගෝනුස්සන්ද පාගන්ටත්, සතුරාගේ මුළු ශක්තිය මැඩපවත්වන්ටත් මා විසින් නුඹලාට බලයදී තිබේ. කොයි දෙයකින්වත් නුඹලාට අන්තරායක් නොවන්නේය" (ලූක් 10:19).**

අපි ඇදහිල්ලෙන් මේ බලය පාවිච්චි කරමු. ඇදහිලිවන්ත සෙනග සභාවක් වශයෙන්, පවුලක් වශයෙන්ද කණ්ඩායමක් වශයෙන්ද පුද්ගලිකවද දේව වචනය නමැති කඩුවක් ඇදහිල්ලේ පළිහක් ගෙන අනෙකුත් (**එපීස 6:10-18**) යුද්ධායුධ ඇතිව යාච්ඤා සටන ගෙන යන අතර දෙවියන්වහන්සේ අපට නැවතත් සමාදාන කාලයක් ගෙන දෙනවා ඇත.

**- ගුරුහරු -**

ළමා පිටුව

# සැබෑ ප්‍රීතිය



ඉතින් දුවේ පුතේ, අපි 2020 වර්ෂයේ අවසානයට ඇවිත්. මේ වර්ෂය දෙස ආපසු හැරී බැලුවොත් වෙනස්ම ආකාරයේ අත්දැකීම් වලට මුහුණ දෙන්නට සිදුවූ වර්ෂයක් ලෙස හඳුන්වන්නට පුළුවන්. පුංචි ඔයාලට වගේම වැඩිහිටි අපටත් දෙවියන්වහන්සේගේ ප්‍රේමය පුදුමාකාර ලෙස අත්දකින්නට පුළුවන්වුන වර්ෂයක්. අපි මොන විදිහේ අත්දැකීම්වලට මුහුණ දුන්නත් අපව ඒ සියල්ලෙන් අපේ දෙව්පියාණන් අප ආරක්‍ෂා කර අප සමඟ සිටින නිසා උන්වහන්සේට ස්තූති ප්‍රශංසා වේවා!

දුවේ පුතේ, ඉතින් දෙසැම්බර් මාසය කිව්වාම ඔයාලට මොනවාද මතක්වෙන්නේ? ඔව්, "නත්තල". නමුත් මේ වර්ෂයේ නත්තල් සැමරුම් නම් බොහෝදුරට සීමාවන් තුළට කොටුවෙන්න පුලුවන්. වෙනදා වාගේ වීදි පුරා දැල්වෙන විදුලි ආලෝක, සැණකෙළි, සාප්පු සවාරි, උත්සව වල වෙනසක් හෝ අඩුවක් තියේවී. ඒවගේම ඔයාට යාලුවෝත් එක්ක එකතුවෙලා විනෝද වෙන්න වගේම නෑදෑ හිත මිතුරන් එක්ක නත්තල් රාත්‍රිය ගතකරන්නත් බැරි වේවි. එහෙම කිව්වම පුංචි ඔයාට මොකද හිතුනේ? "අනේ.. මේසැරේ නත්තල නම් කිසිම සතුටක් නැති වේවි" කියලා නේද? නැහැ දුවේ පුතේ, මේ කිසිම දෙයකින් නත්තලේ ප්‍රීතිය නැතිවෙන්නේ නැහැ. මොකද නත්තලේ ප්‍රීතිය රැඳී තියෙන්නේ මේ පාට සැරසිලිවලවත් සැණකෙළි, සාප්පු සවාරි, ප්‍රණීත කෑම බීම වල හෝ නත්තල් උත්සව වල නෙමෙයි.

ඇඳුම් පැළඳුම් ඔබේ සිතට සමාදානයක් ගෙන එන්නේ නැහැ. නමුත් ඔබ දෙමව්පියන් තේරුම් ගෙන ඔවුන්ගේ සිත සතුටු කළේ නම් ඇත්තටම එය සැබෑ ප්‍රීතියකි. යේසුස්වහන්සේ තුළ සැබෑ ප්‍රීතියයි.

දරුවෙනි ඔබගේ නිවසේ නත්තල් සාදයක් සූදානම් කළායැයි සිතන්න. පැය කිහිපයකට පසු එය අවසන් වෙයි. ඉන් පසු ඔබට සතුටක් දැනෙයිද? නැතිනම් ඔබට එය සැණසිලිදායක හැඟීමක් දැනෙයිද? එසේ නැතිනම් මෝඩකමක් කලායැයි සිතේද? ඔබට අන් අය සමඟ බෙදාගන්නට පුළුවන්ව තිබියදී අප සියල්ල භුක්තිවිඳීම හෝ එක්රැස් කර ගැනීම නත්තලේ සැබෑ ප්‍රීතිය නොවේ. ඔබේ දෙමාපියන් හා පවුලේ අය සමඟ හෝ නැති බැරි අය සමඟ බෙදාගැනීමත්, වේලාව ගතකිරීමත් සැබෑ සතුටක් ගෙන දේ. අන් අය සතුටු කිරීම නත්තලේ සැබෑ අරුතයි. ඒ තුලින් දෙවියන්වහන්සේගේ

සමාදානය අප තුලට ගලා එනු ඇත. ඒ සමාදානය තමයි අපගේ සැබෑම ප්‍රීතිය. නත්තලේ සැබෑ අරුත නම් ත්‍යාග ශීලීභාවයයි.

දුවේ පුතේ අපිව පාපයෙන් ගලවාගත් යේසුස්වහන්සේ ගව මඩුවක උපත ලබා අප පව් නිසා කුරුසියේ මැරී තුන් දවසකට පසු මරණින් නැගිට දැන්, ස්වර්ගයේ සිටින සේක. උන්වහන්සේ පුංචි ඔබේ හඳවත දකින සේක. ඔබේ සිතුවිලි, ආශාවන්, මේ හැම දෙයක්ම උන්වහන්සේ දකින සේක. ඔබ උන්වහන්සේව සතුටු කරන ලෙස හැසිරෙන්නේ නම් එයට උන්වහන්සේ ප්‍රසන්න වන සේක. යේසුස්වහන්සේ තවදුරටත් ගව මඩුවක සිටින බිළිදෙකු නොවේ. උන්වහන්සේ අපේ දෙවියන්වහන්සේය.

**"නමුත් යහපත්කම් කරන්නටත්, අනුන්ට බෙදා දෙන්නටත් මතක නැති නොකරල්ලා. මක්නිසාද එයාකාර පූජාවලට දෙවියන්වහන්සේ ප්‍රසන්න වන සේක"**
**(හේබ්‍රෙව් 13:16)**

යේසුස්වහන්සේ තුළ සැබෑ ප්‍රීතිය අත්විඳීමට ඔබත් ආශාවන්න.

යේසු පිහිටයි.

**ආදර**

**- ශෂිලා නැන්දා -**

## අප මධ්‍යස්ථානයේ පැවැත්වෙන රැස්වීම්

### ඉරිදා

★ **පෙ.ව. 8.15 - 9.15**
ඉරිදා පාසැල
(අවුරුදු 3 - 18 දක්වා ළමුන් සඳහා)

★ **පෙ.ව. 9.30 - 12.00**
රොටි කැඩීමේ හා නමස්කාර රැස්වීම
(සිංහල, දෙමළ, ඉංග්‍රීසි)

★ **ප.ව. 4.00 - 5.00**
සුභාරංචි රැස්වීම - (සිංහල)

★ **ප.ව. 6.00 - 7.00**
සුභාරංචි රැස්වීම - (ඉංග්‍රීසි)

### අඟහරුවාදා

★ **ප.ව. 6.30 - 7.30**
සුභාරංචි රැස්වීම (දෙමළ)

### බදාදා

★ **ප.ව. 6.30 - 7.30**
යාච්ඤා රැස්වීම.
අසනීප අය සඳහා තෙල් ආලේප කර යාච්ඤා කිරීම.

### සිකුරාදා

★ **ප.ව. 6.30 - 7.30**
බයිබල් අධ්‍යනය

# 2021 නව වසර

## ඔබ සැමට දෙවියන්වහන්සේගේ
## කරුණාව, අනුග්‍රහය, සමාදානය හා
## ආශිර්වාදය පිරි නව වසරක් වේවායි
# සුභ පතන්නෙමු !

අප මධ්‍යස්ථානයේ පැවැත්වෙන රැස්වීම් වලට ඔබත්
Face Book හා අන්තර්ජාලය ඔස්සේ
සම්බන්ධ වී ආශිර්වාද ලබා ගන්න.

www.christianfellowshipcentre.com

Cfc Colombo (Christian Fellowship Centre)

**ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය**
අංක - 07, විවේකානන්ද පාර,
වැල්ලවත්ත,
කොළඹ 06.
දුරකථන අංක : 011 2 581 901 / 077 8 813 197
www.christianfellowshipcentre.com

NMA GRAPHICS
No. 246/1, Galle Road, Ratmalana.
Tel: 011 2 730 644 / 071 4 286 295 / 077 4 223 020
E-mail : nmagraphics2001@gmail.com